# සීගිරි ලියන්ගෙන් සමාජ තත්ත්වය නිරූපණය වේ ද?

ඩී. එල්. රණේපුර
ඉතිහාස අධ්‍යයන අංශය
විශේෂවේදී දෙවන වසර
කැලණිය විශ්වවිද්‍යාලය
dineshikarnepura@gmail.com

**සංක්ෂේපය**

අනුරාධපුර යුගයේ රාජත්වයට පත් වූ කාශ්‍යප රජු සිය රාජධානිය වශයෙන් තෝරා ගනු ලැබූයේ සීගිරිය යි. සීගිරිය වනාහි ඓතිහාසික සෑම අංශයක් තුළින්ම ඉතා වැදගත් වූ උරුමයකි. ඒ අනුව එහිලා සීගිරි සිතුවම් වැදගත් ය. ආදි සිංහල සිත්තරුන්ගේ ශිල්පීය දක්ෂතා පෙන්නුම් කෙරෙන විශිෂ්ට නිර්මාණයක් වන්නේ සීගිරි කාන්තා සිතුවම් ය. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ප්‍රස්තුත කාලය තුළ සමාජ තත්ත්වය සීගිරි කාන්තා සිතුවම්වලින් නිරූපණය වේ දැයි විමර්ශනය කිරීමයි. එහිදී ක්‍රමවේදය ලෙස පුරාවිද්‍යාත්මක සාධකයක් වන සීගිරි කුරුටු ගී උපයෝගී කොට ගැනුණි.

සීගිරියේ පර්වත බෙයදයෙහි ඇඳ තිබූ කාන්තා සිතුවම් පන්සියයක් පිළිබඳව සීගිරි ගීවලින් කියැවේ. නමුත් වර්තමානයේ දක්නට ඇත්තේ 21ක් පමණි. මෙම කාන්තා සිතුවම් ජීවමාන අයුරින් ඇඳ ඇති අතර ඒවායේ නිරූපිත වස්ත්‍ර, හිස් පළඳනා, ගෙල පළඳනා, වළලු හා කර්ණාභරණ විවිධ අයුරින් නිර්මාණය කොට ඇත. ඔවුන් එක් කුලයකට අයත් වූවා නම් ඔවුන්ගේ බාහිර පළඳනා එක හා සමාන විය යුතු ය. එක් කාන්තාවක් උඩුකය නිරාවරණය කරන විට තවත් අයෙකු උඩුකය ආවරණය කර තිබීමෙන් ද පැහැදිලි වනුයේ එය සමාජ තරාතිරමක් මත සිදු වූ බවයි. ආභරණ අතින් ද එකිනෙකා එක හා සමාන නො වේ.

7 වන සියවසේ සිට සියවස් හයකට ආසන්න කාලයක් තුළ සීගිරි ගී රචකයින් මේ සීගිරි ළඳුන් දැක තම සිතැඟි පළ කළේ ය. ඒ අනුව සීගිරි චිත්‍ර ඇඳීමෙන් සියවස් තුනකට පසුකාලීන ව කළ මෙම රචනා තුළ ද සැමියා මළ වියෝවෙන් හඬන රාජකීය කාන්තාවන් බව දැක්වීමෙන් ඔවුන් බැලූ බැල්මට මේ සිටින්නේ කවුරුන් දැයි හඳුනාගන්නට ඇතැයි සිතිය හැකි ය. ඒ අනුව මේ සීගිරි සිතුවම්වලින් රජමැඳුරේ බිසෝවරු, අන්තඃපුර කාන්තාවන් මෙන්ම සේවිකාවන් ද නිරූපණය කළා විය හැකි ය. එබැවින් ඔවුන් සමාජයේ විවිධ තරාතිරම් නිරූපණය කළ බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද: සීගිරි කාන්තාව, සීගිරි සිතුවම, සීගිරි කුරුටු ගී**